Australian Government
Department of Home Affairs

# නොමිලේ ලබාදෙන භාෂණ පරිවර්තන සේවා

## කෝවිඩ්-19 හේතුවෙන් සේවා සම්බන්ධයෙන්සිදුවන වෙනස්කම්

කෝවිඩ්-19 තත්වයයටතේ ඉංග්‍රීසිනිපුණතාවයනැති හෝ අඩුඉංග්‍රීසිනිපුණතාවයඇති අය සම්බන්ධයෙන් ගුණාත්මකභාවයෙන් යුත් භාෂණපරිවර්තන සේවා භාවිතා කිරීමඉතා වැදගත්වේ.

භාෂණපරිවර්තන සේවා ඇතිඅවස්ථාවලඑවා උපයෝගීකරගතයුතුය.

**කෝවිඩ්-19 සහළුහි රෝගලක්ෂණ**සම්බන්ධයෙන් දැනගන්න.

## නොමිලේ ලබාදෙනභාෂණපරිවර්තන සේවා යනු මොනවාද?

ඔබපහතකාණ්ඩයකටඅයත්වේ නම්, ඔබට නොමිලේ ලබාදෙනභාෂණපරිවර්තන සේවා ලබාගතහැකියඃ

- ඕස්ට්‍රේලියාවේ සිටිනම්
- මෙඩිකෙයා කාඩ්පතක් ඇතිනම්;සහ
- අඩුඉංග්‍රීසි භාෂා නිපුණතා ඇතිනම්.

## නොමිලේ ලබාදෙනභාෂණපරිවර්තන සේවා සඳහා මා විසින්ප්‍රවේශයලබාගන්නේ කෙසේද?

පහත සේවා සපයන්නන් විසින් නොමිලේ ලබාදෙනභාෂණපරිවර්තනසේවා සඳහා ඔබ වෙනුවෙන් ප්‍රවේශයලබාගතහැකියඃ

- පුද්ගලික වෛද්‍යවෘත්තීකයන්
- ඖෂධවේදීන්
- රජයේ නොවනසංවිධාන
- දේපළ වෙළඳාම්ආයතන
- නගරසභා වැනිපළාත් පාලනආයතන
- වෘත්තීයසමිති;සහ
- පාර්ලිමේන්තුමන්ත්‍රීවරුන්.

මෙම සේවා සම්බන්ධ වැඩිදුරවිස්තර සඳහා **මෙතැන**බලන්න.

ඔබගේ භාෂාවෙන් තොරතුරු සහඋපදෙස් ඔබට ලැබෙන බවතහවුරු කිරීම සඳහා ඔබගේ සේවා සපයන්නා විසින් මිනිත්තුකිහිපයක් ඇතුලතඔබවදුරකථන මගින් භාෂණපරිවර්තකයෙකුසමගසම්බන්ධ කරදියහැකිය.

## භාෂණපරිවර්තකයන්

භාෂා සහභාෂණපරිවර්තකයන් සඳහාවූජාතිකප්‍රතීක අධිකාරිය (National Accreditation Authority for Translators and Interpreters (NAATI)) මගින් පිළිගත් භාෂණපරිවර්තකයන් උපයෝගීකරගනී.භාෂණපරිවර්තකයන් වෘත්තීයආචාරධර්ම සංග්‍රහයක් මගින් බැඳී ඇතිඅතරපහතආකාරයටකටයුතු කල යුතුයඃ

- නිවැරදිවසහඅවංකව තොරතුරු පරිවර්තනය කල යුතුය
- රහස්‍යභාවයආරක්ෂාකල යුතුය
- අපක්ෂපාතීසහවිෂයමූලිකවියයුතුය;එමෙන්ම
- සෑමඅවස්ථාවකමවෘත්තීයටගැලපෙනආකාරයටකටයුතු කලයුතුය.

නොමිළේ ලබාදෙනභාෂණපරිවර්තන සේවාවේ ප්‍රතිපත්තියවන්නේ ලබාගතහැකිඉහළමපිළිගැනීමඇතිභාෂණපරිවර්තකවඋපයෝගීකරගැනීමවේ. මේ හේතුවනිසාවිශේෂිත භාෂා පරිවර්තකයෙකුඉල්ලා සිටීමටඔබවඋනන්න්දු නොකෙරේ.

## FIS (Free Interpreting Services - නොමිළේ ලබාදෙනභාෂණපරිවර්තන සේවා) මගින් ලබාදෙන සේවා මොනවාද?

- ක්ෂණිකව ලබාදෙනදුරකථන භාෂණපරිවර්තන සේවා. මෙම සේවාවසැලසුම් නොකලභාෂණපරිවර්තන සඳහා ඉතාමප්‍රයෝජනවනඅතරපහත දේ ලබාදේඃ
    - 160කට අධික භාෂාවලින් භාෂණපරිවර්තකයන් 3,000 කටවැඩි දෙනෙකුටප්‍රවේශය
    - භාෂණපරිවර්තන සේවයදිනකටපැය 24ක් පුරා සහසතියකටදින 7ක් පුරා ඇත
    - ඇමතුම ගෙනමිනිත්තුකිහිපයක් ඇතුලතභාෂණපරිවර්තකයෙකු හා සම්බන්ධවීම.
- කලින් වෙන්කරගත් භාෂණපරිවර්තනඃ
    - වැඩිපුරභාවිතා නොවන භාෂාවක් නම්, කලින් කථිකා කරගත්භාෂණපරිවර්තන සේවාවක් යොදා ගැනීමප්‍රයෝජනවත්වේ.